# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 5 දරන හර බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 10.75 යි.** තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2003 අංක 5 දරන හර බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වැනි දින]

එල්. ඩී.–ඕ. 90/2002

**2002 අංක 16 දරන හර බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2003 අංක 5 දරන හර බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 16 දරන හර බදු පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 16 දරන හර බදු පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :–

"හරබදු අයකිරීම.

2. 13 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, හර බදු යනුවෙන් හැඳින්වෙන බද්දක් —

(අ) වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන එක් එක් ජංගම ගිණුමකින් එක් එක් ලිත් මාසයක් තුළ කරනු ලබන මුළු හර කිරීම්වල එකතුව මත ;

(ආ) වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක පවත්වාගෙන යනු ලබන එක් එක් ඉතිරි කිරීමේ ගිණුමකින් එක් එක් ලිත් මාසයක් තුළ කරනු ලබන මුළු හර කිරීම්වල එකතුව මත ; සහ

(ඇ) තැන්පතු සහතිකයක් හෝ සංචාරක චෙක්පතක් මුදල් කිරීමෙන් උපලබ්ධ වන මුදල මත,

අවස්ථාවෝචිත පරිදි එම හර කරනු ලබන මුළු මුදලින් හෝ මුදල් කිරීමෙන් උපලබ්ධ වන මුදලින්, සියයට එකකින් දහයෙන් එකක අනුප්‍රමාණය අනුව, නියම කර අය කර ගනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(අඅ) වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමකින් කරන ලද හරකිරීමක් සම්බන්ධයෙන් වන විට, ගිණුම පවත්වාගෙන යන්නේ කවර තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නමින් හෝ නම්වලින් ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(අඅ) වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමකින් කරන ලද හරකිරීමක් වන විට, එම හරකිරීම සිදු කරනු ලැබූ මාසයේ අවසානයේ දී ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "ජංගම ගිණුම් ගනුදෙනු වලින්" යන වචන වෙනුවට "ජංගම ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් ගනුදෙනුවලින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සෑම වාණිජ බැංකුවක්" යන වචනවල සිට "ප්‍රේෂණය කළ යුතු ය." යන වචන දක්වා සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :-

"(1) සෑම වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් ම විසින් එක් එක් මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී ඒ බැංකුවේ පවත්වාගෙන යනු ලබන සෑම ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් ම ඒ ඒ මාසය වෙනුවෙන් ඒ ගිණුමෙන් හර බදු වශයෙන් ගෙවිය යුතු මුදලට සමාන මුදලක් අස්කර ගෙන ඒ ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ අවසාන වැඩ කරන දිනයේ දී හෝ ඊට ප්‍රථම ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය. " ;

(2) 1 වන උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ "යම් මාසයක ආරම්භය" යන වචන වෙනුවට "යම් මාසයක අවසාන දිනය" යන වචන ආදේශ කිරීමෙන්. ;

(3) 1 වන උපවගන්තියේ දෙවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :–

"එසේම තවදුරටත් කිසියම් මාසයක ජංගම ගිණුමක හෝ ඉතිරි කිරීමේ ගිණුමක හර බදු බැරකම රුපියල් විස්සකට අඩු නම්, ඒ ජංගම ගිණුමෙන් හර බදු අස්කර නොගත යුතු ය." ;

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "එම ජංගම ගිණුම වාණිජ බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකුගේ නමින් ද, ඒ තැනැත්තාගේ හෝ "යන වචන වෙනුවට "එම ජංගම ගිණුම හෝ ඉතිරි කිරීමේ ගිණුම වාණිජ බැංකුවෙහි හෝ විශේෂිත බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නමින් ද, ඒ තැනැත්තා හෝ තැනැත්තන්, හෝ " යන වචන ආදේශ කිරීමෙන් :

(5) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ –

(අ) "ජංගම ගිණුමක් යම් වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලැබේ ද ඒ වාණිජ බැංකුවට යම් මාසයකට පෙරාතුව ම වූ මාසයේ දී ඒ ගිණුමෙන් කරන ලද හර කිරීම් මත ගෙවිය යුතු හර බදු සම්පූර්ණයෙන් අයකර ගැනීමට හෝ ඉන් කොටසක් අයකර ගැනීමට ඒ ජංගම ගිණුමේ අරමුදල් නොමැතිවීම නිසා හෝ ඒ ජංගම ගිණුමේ ප්‍රමාණවත් අරමුදලක් නොමැතිවීම නිසා" යන වචන වෙනුවට "ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් යම් වාණිජ බැංකුවට හෝ විශේෂිත බැංකුවට, ඒ මාසය වෙනුවෙන් ඒ ගිණුමෙන් කරන ලද හරකිරීම් මත ගෙවිය යුතු හර බදු සම්පූර්ණයෙන් අයකර ගැනීමට හෝ ඉන් කොටසක් අයකර ගැනීමට ඒ ජංගම ගිණුමේ

හෝ ඉතිරි කිරීමේ ගිණුමේ අරමුදල් නොමැතිවීම නිසා හෝ ඒ ජංගම ගිණුමේ හෝ ඉතිරි කිරීමේ ගිණුමේ ප්‍රමාණවත් අරමුදලක් නොමැතිවීම නිසා'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ ''එකී පෙරාතුව ම වූ මාසයේ දී'' යන වචන වෙනුවට ''ඒ මාසය වෙනුවෙන්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(6) (4) වන උපවගන්තියේ අතුරු විධානයේ ''එම වාණිජ බැංකු විසින්'' යන වචන වෙනුවට ''එම වාණිජ බැංකුව හෝ විශේෂිත බැංකුව විසින්'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(7) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ :—

(අ) ''යම් වාණිජ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක්'' යන වචන වෙනුවට ''යම් වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක්'' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ''වාණිජ බැංකුවකට බලය පැවරෙන්නේ යයි'' යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කර, ඒ වෙනුවට ''වාණිජ බැංකුවකට හෝ විශේෂිත බැංකුවකට බලය පැවරෙන්නේ යයි නොසැලකිය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ ''යම් ජංගම ගිණුම් හිමියකු විසින්'' යන වචන වෙනුවට ''යම් ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුම් හිමියකු විසින්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි ''ජංගම ගිණුමකින් කරන ලද'' යන වචන වෙනුවට ''ජංගම ගිණුමකින් හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් කරන ලද'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තියේ :—

(අ) "වාණිජ බැංකුවක් විසින්" යන වචනවල සිට "කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය :— "

යන වචන දක්වා වූ සියලුම වචන වෙනුවට "වාණිජ බැංකුවක් විසින් හෝ විශේෂිත බැංකුවක් විසින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් මුදල් ප්‍රමාණයන් ප්‍රේෂණය කරන විට දී, ගනුදෙනුකරුවකු වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විශේෂ ජංගම ගිණුමක් සම්බන්ධයෙන් හැර, යම් ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු ඇතුළත් ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය :—"

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) ඒ බැංකුවේ පවත්වාගෙන යන සියලු ජංගම ගිණුම්වලින් සහ ඉතිරි කිරීමේ ගිණුම්වලින් ඒ මාසය වෙනුවෙන් කරන ලද හර කිරීම්වල මුළු ප්‍රමාණය ; "

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය අත්හැරීමෙන් ;

(ඈ) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "සියලු ජංගම ගිණුම්වලින් " යන වචන වෙනුවට "සියලු ජංගම ගිණුම්වලින් සහ ඉතිරි කිරීමේ ගිණුම්වලින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) (ඉ) ඡේදයේ "එක් එක් ජංගම ගිණුමේ නිදහස් කරන ලද මුළු හර කිරීම් ප්‍රමාණය, ඒ අදාළ ජංගම ගිණුමේ" යන වචන වෙනුවට "එක් එක් ජංගම ගිණුමේ සහ ඉතිරි කිරීමේ ගිණුමේ නිදහස් කරන ලද මුළු හර කිරීම් ප්‍රමාණය, ඒ අදාළ ජංගම ගිණුමේ හෝ ඉතිරි කිරීමේ ගිණුමේ" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(1අ) වාණිජ බැංකුවක් විසින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් මුදල් ප්‍රමාණයන් ප්‍රේෂණය කිරීමේ දී, ඒ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සියලු විශේෂ ජංගම ගිණුම්වලින් ඒ මාසය වෙනුවෙන් කරන ලද හරකිරීම්වල මුළු ප්‍රමාණය දක්වමින් යම් විශේෂ ජංගම ගිණුමක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශයක් සැපයිය යුතු ය.

(1ආ) වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් විසින් එක් එක් මාසය අවසානයේ දී ස්වකීය ගනුදෙනු සම්බන්ධයෙන් පහත දැක්වෙන විස්තර ඇතුළත් ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය :–

(අ) යම් විශේෂ මාසයක දී හර බදුවලට යටත් ගනුදෙනු සම්බන්ධයෙන් කරන ලද හර කිරීම්වල මුළු අගය ;

(ආ) යම් විශේෂ මාසයක දී හර බදු වශයෙන් අස්කර ගන්නා ලද මුදල් ප්‍රමාණය ;

(ඇ) යම් විශේෂ මාසයක දී කරන ලද හර බද්දෙන් නිදහස් ගනුදෙනුවල මුළු අගය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වාණිජ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකින්" යන වචන වෙනුවට සහ "වාණිජ බැංකුවක් වාර්තා කළ අවස්ථාවක" යන වචන වෙනුවට පිළිවෙලින් "වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකින් හෝ ඉතිරි කිරීමේ ගිණුමකින්" යන වචන සහ "වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් විසින් වාර්තා කළ අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) ඒ වාණිජ බැංකුවෙහි හෝ විශේෂිත බැංකුවෙහි පවත්වාගෙන යන ජංගම ගිණුමකින් හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් යම් මාසයක දී කරන ලද හර කිරීම්වල මුළු මුදල වන ; හෝ".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ–

(අ) (අ) ඡේදයේ "පවත්වාගෙන යනු ලබන යම් ජංගම ගිණුමකින්" යන වචන වෙනුවට "පවත්වාගෙන යනු ලබන යම් ජංගම ගිණුමකින් හෝ ඉතිරි කිරීමේ ගිණුමකින්" යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) (ආ) ඡේදයේ "යම් තැනැත්තකු විසින්, හුදෙක් පහත සඳහන් කාර්ය සඳහා, එනම් :–" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින් පහත සඳහන් කාර්ය සඳහා ; එනම් :–" යන වචන ආදේශ කිරීමෙන් සහ "සඳහා එම ගිණුම" යන වචනවල සිට "විශේෂ ගිණුමක් මත" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට, "සඳහා වාණිජ බැංකුවක විවෘත කරන විශේෂ ගිණුමක් වන" යන වචන ආදේශ කිරීමෙන් :

(ඇ) එහි (ඇ) ඡේදයෙහි –

(i) "ගිණුම හුදෙක් පහත සඳහන්" යන වචනවල සිට "ගෙවීම් සඳහා කරන හර කිරීම් :-" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "මෙහි පහත නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු විසින්, පහත සඳහන් ගෙවීම් කිරීමේ කාර්යය සඳහා වාණිජ බැංකුවක විවෘත කරන යම් විශේෂ ගිණුමක් වන ජංගම ගිණුමකින් කරන හර කිරීම් :-"යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ඡේදයේ (iii) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :-

"(iii) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතට අනුකූලව, යම් ලියාපදිංචි ස්කන්ධ නිකුත් කිරීමක දී, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, ස්කන්ධ මිලදී ගැනීම සම්බන්ධව කරන ගෙවීම් :

(iiiඅ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතට අනුකූලව යම් සුරැකුම්පත් නිකුත් කිරීමක දී සහ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතට අනුකූලව යම් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමක දී, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ස්කන්ධ හෝ සුරැකුම්පත් මිලදී ගැනීම සම්බන්ධව කරන ගෙවීම් :

(iii) එහි (vii) අනුඡේදයේ—

(i) "වෙනත් වාණිජ බැංකුවක" යන වචන වෙනුවට "එම බැංකුවේ හෝ වෙනත් වාණිජ බැංකුවක" යන වචන ආදේශ කිරීමෙන් :

(ii) "හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ වෙනත් යම් මූල්‍යමය අතරමැදියකු" යන වචන වෙනුවට "හෝ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කළ, මූල්‍යමය මැදිහත්වීමේ කටයුතුවල නිරතව සිටින වෙනත් යම් අස්තිත්වයක් විසින්" යන වචන ආදේශ කිරීමෙන් :

(iii) එහි (vii) (ඇ) අනුඡේදයේ "මූල්‍ය අතරමැදියන්" හෝ "මූල්‍ය අතරමැදියකු" වන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට "මූල්‍ය අතරමැදි කටයුතුවල නිරතව සිටින වෙනත් යම් අස්තිත්වයක්" යන වචන ආදේශ කිරීමෙන් :

(iv) ඒ ඡේදයේ (viii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :-

"එසේ වූවද (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නිදහස් කිරීමේ කටයුතු එක් විශේෂ ජංගම ගිණුමක් හරහා යොමු කරනු ලැබිය යුතු ය. එක් එක් නිදහස් කිරීම් කටයුත්තක් සඳහා වෙන වෙනම වූ ප්‍රකාශයක් කළ යුතු අතර ඒ ගිණුම හර බදු නිදහස් කිරීමේ කටයුතු සඳහා ම පමණක් භාවිත කරන බවට වූ පොරොන්දුවක් එකවර දිය යුතු ය. ".

(ඇ) එහි (ඈ) ඡේදයේ —

(i) "යම් ජංගම ගිණුමකින්" යන වචන වෙනුවට "යම් ජංගම ගිණුමකින් හෝ ඉතිරි කිරීමේ ගිණුමකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) එහි (i) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) එකම ගිණුම් හිමියකුගේ නමින් ඇති එක් ජංගම ගිණුමකින් වෙනත් ජංගම ගිණුමකට හෝ ජංගම ගිණුමකින් ඉතිරි කිරීමේ ගිණුමකට හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් ජංගම ගිණුමකට හෝ එක් ඉතිරි කිරීමේ ගිණුමකින් වෙනත් ඉතිරි කිරීමේ ගිණුමකට එකම වාණිජ හෝ විශේෂිත බැංකු ඇතුළත නැතහොත් වෙනස් වාණිජ හෝ විශේෂිත බැංකු අතර, අරමුදල් මාරු කිරීම නියෝජනය කරමින් වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක ඇති එවැනි ගිණුමකින් කරන හර කිරීම" ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) "යම් ජංගම ගිණුමකට" සහ "වාණිජ බැංකුව" යන වචන වෙනුවට "යම් ජංගම ගිණුමකට හෝ ඉතිරි කිරීමේ ගිණුමකට" සහ "වාණිජ බැංකුව හෝ විශේෂිත බැංකුව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :–

"එසේම තවදුරටත්, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (i) වන, (ii) වන හා (iii) වන අනුඡේදවල නිශ්චිතව සඳහන් හර බදු නිදහස් කිරීම් හඳුනා ගැනීමට බැංකුවලට හැකි වන අවස්ථාවල දී, ඉහත නියම කර ඇති පරිදි ගිණුම්හිමියාගෙන් ප්‍රකාශයක් නොමැතිව ම බැංකුව විසින් හර බදු නිදහස් කිරීම් කළ හැකි අතර, ඒ මත හර බදු එකතුකර ගැනීමෙන් වැළැකී සිටිය හැකි ය. එවැනි නිදහස් කිරීමක් ලබාදීම සඳහා වගකීම භාරගැනීමට බැංකුවලට නියම කරනු ලැබිය යුතු ය. එවැනි යම් නිදහස් කිරීමක් ලබා දීමේ දී සිදුවන දෝෂයක් සම්බන්ධව කිසිම බැංකුවක් වගකීමෙන් නිදහස් නොකළ යුතු ය. නිදහස් කිරීමක් ලබා දීමේ දී දෝෂයක් සිදුකරන කවර හෝ බැංකුවක්, එසේ වැරදි සහගත ලෙස ලබාදෙන එක් එක් නිදහස් කිරීම වෙනුවෙන් රුපියල් දස දහසක දණ්ඩනයකට යටත් විය යුතු ය.

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "ජංගම ගිණුමක" යන වචන වෙනුවට "ජංගම ගිණුමක හෝ ඉතිරි කිරීමේ ගිණුමක" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ අලුත් වගන්තියක් ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :–

"කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් බලතල, කාර්ය ආදිය ක්‍රියාත්මක කළ යුතු බව.

14අ. මේ පනතේ විධිවිධාන මගින් හෝ යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති හෝ පැනවී ඇති හෝ භාර වී ඇති යම් බලයක්, කාර්යය හෝ කර්තව්‍යයක් ක්‍රියාවේ යෙදීම, කිරීම හෝ ඉටු කිරීම 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව පත් කරන ලද යම් කොමසාරිස්වරයකුට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරන ලැබේ :–

"වැරදි"

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) "හර" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි, "ජංගම ගිණුම" යන වචන යෙදී ඇති සෑම තැනකම "ජංගම ගිණුම හෝ ඉතිරි කිරීමේ ගිණුම" යන වචන ද "වාණිජ බැංකුව" යන වචන යෙදී ඇති සෑම තැනකම "වාණිජ බැංකුව හෝ විශේෂිත බැංකුව" යන වචන ද ආදේශ කිරීමෙන් ; සහ

(2) "ඉතිරි කිරීමේ ගිණුම" යන යෙදුමෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :–

"ඉතිරි කිරීමේ ගිණුම" යන්නෙන්, බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක පවත්වාගෙන යන්නා වූ ද, පොලිය ගෙවනු ලැබුවා වූ ද, නොලැබුවා වූ ද පොලිය ලැබීමට සුදුසුකම් ඇත්තා වූ ද (විදේශීය ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ ස්ථාවර හෝ කාලය නියමිත තැන්පතු ගිණුමක් නොවන) තවර හෝ ගිණුමක් අදහස් වේ.".

අතීතයට බලපෑම.

**15.** මේ පනතේ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධන 2003 ජනවාරි 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

ඉතිරි කිරීමේ ගිණුම්වලින් හරබදු අයකිරීම සම්බන්ධ වගකීමෙන් ආරක්ෂාව.

**16.** (1) 6 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, 2003 ජනවාරි 1 වන දින සිට සහ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයෙන් අවසන් කාලසීමාව තුළ කවර හෝ ඉතිරිකිරීමේ ගිණුමකින් හර බදු රැස්කර ප්‍රේෂණය කරන යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක් නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙස සැලකිය යුතු අතර එසේ එම බදු රැස්කිරීම හා සම්බන්ධ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී වගකීමෙන් මෙයින් නිදහස් කරනු ලැබේ.

(2) යම් තැනැත්තකු විසින් යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමකින් ඔහු ගෙවීමට යටත් හර බද්ද ඉක්මවන හර බද්දක් රැස් කරන හෝ යම් තැනැත්තකු විසින් බැංකුවක පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමකින් කරනු ලබන, 13 වන වගන්තිය මගින් හෝ යටතේ හර බද්දෙන් නිදහස් කර තිබෙන හර කිරීම්වලින්, ඔහුගෙන් හර බද්දක් රැස්කරන යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක් අවස්ථාවෝචිත පරිදි, 2003 ජනවාරි 1 වන දින සිට හා ඉන් පසුව, ඒ මුදල ආපසු ගෙවනු ලැබූ දිනයෙන් හෝ ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබූ දිනයෙන් අවසන් කාලය තුළ එසේ එම බද්ද රැස් කිරීම හා සම්බන්ධ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී වගකීමෙන් මෙයින් නිදහස් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.